ඕස්ලන්තයේ අභිරහස



රශ්මිකා සිතුම්ලි හේරත්

ඕස්ලන්තයේ අභිරහස

රශ්මිකා සිතුම්ලි හේරත්
කතෘ

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

පන්තිය : 7 ශ්‍රේණිය

කෘතිය පල කරන දිනය : 2025 පෙබරවාරි 08

ISBN 978-624-208-259-2

පිදුම

මහාමායා බාලිකා විද්‍යාලයේ E BOOK ව්‍යාපෘතිය

භාරව කටයුතු කරන

සෙනවිරත්න ගුරුපියාණාන්ටද

විද්‍යාලිය සහකාර විදුහල්පතිනි

දිල්රුකා ඇරැගොඩ මහත්මියට ද

නිතරම මාව දිරිමත් කළ

මාගේ ආදරණිය දෙමාව්පියන්ට මාගේ දගකාර මල්ලියා ට ද

මෙම පොත ගෞරවයන් පුදමි

පෙරවදන

සාහිත්‍ය දීයුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

තාත්තාට ලැබුණු රැකියා ස්ථාන මාරුවත් සමඟ වසන්ත කාලයේ කැතරිනා සහා ලුපීටා ඇතුළු පවුල ඕස්ලන්තයේ ඕසම් විදියේට නිවසකට පදිංචියට පැමිණියහ.

එහි පැමිණෙන විට මඟ දෙපස තිබු විවිධ වර්ගයේ ඇඳුම් පැලඳුම් ,රන් ආභාරණ වැනි විවිධ භාණ්ඩ සියලු දෙනාගේ ම ආකර්ශනයට ලක්විය. ඔවුන් ඇඳුම් කිහිපයක් හා රන් භාණ්ඩ කිහිපයක් ගත්හ. පසුව ඔවුන් ඇරපියටනල් භෝජනාගාරයට ගොස් ආහාර ලබා ගත්හ.

ඉන්පසු ඔවුන් D 40 ගොඩනැගිල්ලේ 5 මහලේ තම අලුත් නිවාසයට ගොස් ස විවේක ගත්හ. එහි කාමර 6 ක් සහ ආලින්දයක් ද විය. අම්මා ආලින්දයේ තිබු මේසය මත මල් පොච්චියක් තබා මේසය අලංකාර කළාය.

ලුපීටා, කැතරිනා, නංගි සහ මල්ලි තම තමන්ගේ කාමර වලට ගොස් තම ඇඳුම් අල්මාරි වල තැබූහ. කාමරයෙන් පිටත අලංකාර ලෙස මල් වවා තිබුණි.

“මම මේ වගේ ගෙදරක් මම කවදාවත් ඒකක් දැකලා නෑ” කැතරීනා පැවසුවාය. ආලින්දයේ එල්ලා තිබු වලට චිත්‍ර වලට කවුරුත් කැමති වුහ .

එදා හවසම ඔවුන්ට ඕසම් විදියේ උත්සවයකට ආරාධනා පතක් ලැබිණි.

“අම්මේ අපි මේ නාට්‍යය බලන්න යමුද ? ” ලුපිටා මවගෙන් ඇසුවාය.

“හා, අපි බලන්න යමු කාලෙකින් නාට්‍යයක් බැලුවෙත් නැහැනේ”මව කීවාය

තාත්තා ද එයට එකඟ විය .

අපි නාට්‍ය බලන්නට යන විට මඟ දෙපස අලංකාර ලෙස කොඩි එල්ලා තිබුණි.

“ශා ... හරිම ලස්සනයි මේ පාර දෙපැත්ත ” මල්ලී කීවේය.

ඔවුන් ප.ව 5. 25 පමණ වන විට වෙම්ලි හොල් එක අසළට ගියහ .

තාත්තා ටිකට් පත් බෙදන්නාගෙන් ටිකට් 7ක් මිලදී ගත්තේය. ඉන්පසු ඔවුන් ශාලාව ඇතුළට ගොස් නියමිත අසුන්වල අසුන් ගත්තේය. ටික වේලාවකින් නාට්‍ය ආරම්භ වි එය පැය දෙක හමාරකට පසුව අවසන් විය.

''මේක හරියට අපි බලපු වටිනා මාලය කියන නාට්‍ය වගෙමයි'' කැතරිනා පැවසුවාය.

''ඔව් ටිකක් ඒ වගෙයි, දැන් ගොඩක් රෑ වෙලා අපි ගෙදර යමුද?'' අම්මා පැවසුවාය.

ඔවුන් ප. ව 9.00 පමණ සිය අලුත් නවාතැනට පැමිණියහ. තාත්තා රාත්‍රී ආහාර කඩෙන් ගෙනත් තිබුණි. සියලු දෙනාම එම ආහාර ගෙන සතුටින් නින්දට ගියෝය.

පසුදින උදෑසනම අම්මා අවදිවී කෑම පිසූ පසු ඔවුන් පෙ.ව 8. 00 ට පමණ උදේ ආහාරය ගත්හ.

''අපේ ගෙදර උයන බඩු ගොඩක් ඉවරයි අද market යන්න වෙයි'' මව පැවසුවාය.

''එහනෙම් ඕන කරන බඩු ටිකයි , මේ ළමයින්ට ඕන දේවලුයි ලියා ගෙන හැමෝම යමු'' තාත්තා කිව්වේය.

'' මට සෙල්ලම් කාර් එකක් ඕනේ '' මල්ලි කිව්වේ ය. ''මට රෝස පාට teddy bear කෙනෙක් ඕනේ'' නංගි කිව්වාය.

'' මට කතා පොතක් ඕන'' කැතරීනා කීවා ය. මටත් කතා පොතක් ඕන'' ලුපීටා ද කිව්වාය .

ඉන්පසු ඔවුන් සෆාරි අධි වෙළඳසැලට ගොස් අවශ්‍ය බඩු රැගෙන දහවල් කෑම හෝටලයකින් කා හවස් වරුවේ නිවසට පැමිණියහ .

“තාත්තා අපි දවසක children park එකකට යමුද? ගෙදරටම වෙලා ඉන්න එපා වෙනවා ” මල්ලි ඇසුවේය.

“යමු යමු මම කියන්ට හිටියේ මෙහේ තියෙනවා ලස්සන park එකක් ඒකේ ගොඩක් ඇවිදින්ටත් තියෙනවාලු අපි ඒකට යමු” තාත්තා කිව්වේය .

ඔවුන් එම උද්‍යාණයක් බැලීමට පසුවදා උදයම පිටත් විය.

“ශා... හරිම ලස්සන park එකක් ” නංගි පැවසුවාය .

“ඒ වගේම මෙහේ තියෙන මලුත් හරිම සුවඳයි, පාර දෙපැත්තේ තියනෙ ලොකු ගස් නිසා හෙවනත් තියෙනවා ” අම්මා පැවසුවාය .

පසුදින උදෑසනම අවදි වූ අම්මා, තාත්තා, ලුපිටා, කැතරිනා, ආශා, හා ස්ටෙලන් උදේ ආහාරය ගෙන 9.00 ට පමණ මරියානා විද්‍යාලයට ගොස් ලුපිටා හා කැතරිනා සඳහා එයට ඇතුලත් කිරිමට අවශ්‍ය application භාර දුන්නනෝය. ඉන්පසු රෙඩ්රෝස් විද්‍යාලයට ගොස් ස්ටෙලන් හා ආශා ද ඇතුලත් කිරිමට අවශ්‍ය application භාර දුන්නෝය.

පසුදින හතර දෙනම පාසල් වල තිබූ සම්මුක පරික්ෂණ වලට ගියහ. ළමුන් සමඟ සුහඳව කතා කිරිමෙන් අනතුරුව, ඔවුන් පාසල් වලට ඇතුළත් කර ගත් බව පාසල්වලින් දැන්විය.

ඉන්පසු ඒදින හවස් වරුවේ ශායිනි පොත්හලට ගොස් මේ ළමයි තම තමාට අවශ්‍ය පොත් පත් සහ බඩු බාහිර ආදිය මිලට ගත්හ.

පසුදින ළමයි මහත් ආසාවෙන් අලුත් පාසල්වලට ගියහ.

එහිදී ලුපිටාට අලුත් යහළුවෝ 4 දෙනෙක් හමු විය. ඔවුන් ඩෂා, ඔලිෂා, ස්ටෙලා සහ ඔලිවියා නම් විය. ඔවුන්ගේ පාසලේ විෂයන් 5 ක් ඉගැන් විය. ඒවා ගණිත, ජීව විද්‍යාව, ඉංග්‍රීසි, සෞඛ්‍ය හා ශාරිරික අධ්‍යාපනය , පුරවැසි අධ්‍යාපනය, වේ.

ඒ සියල්ලම ඔවුන්ට ඉගැන්වුයේ ඉංග්‍රීසි භාෂාවෙනි. ඔවුන් විවේක කාලය කෙළි සෙල්ලම් කරමින් ගත කර නිවසට පැමිණියහ.

ඉන් දින කිහිපයක් ගත වූ පසු "අම්මා අපිට විද්‍යාව විෂයට පැවරුමක් දුන්නා" කැතරිනා කිවාය.

" ඒ මොකක්ද ?" අම්මා ඇසුවා. "ආහාර ජීර්ණ පද්ධතිය ඇදගෙන එන්න කියලා". කැතරිනා කිවාය.

"දුවේ අපි මෙහෙම කරමු, සුදු විසිල් බෝර්ඩ් එකක් අරගෙන එකේ ආහාර ජීර්නය පද්ධතිය විවිධ පාට වලින් අඳිමු" අම්මා යෝජනා කළාය.

ඊළඟ දවසේ ආශා ද පැමිණ මවට තවත් ආරාධනා පත්‍රයක් දුන්නා. එය දෙන ගමන් " අම්මා අපේ පංතියේ ඇරිස්ගේ උපන්දින උත්සවයට මට එන්න කීවා, අපි එහෙ යමුද එයාට මොනවද දෙන්නේ" යනුවෙන් ප්‍රශ්න වැලක් ඇසීය.

"ආ එහෙමද? අපි එහෙ යමු තව ඔයා කැමති නම් එයාට කෙටි කතා පොතක් දෙමු එයත් ආස වෙයි " මව තම අදහස ඉදිරිපත් කළාය.

නංගි ඇරිස් සඳහා සුභ පැතුමක් ද නිර්මාණය කළාය.

ඔවුහු ශයිනි පොත්හලට ගොස් "***පුංචි රෝස මල්***" යන නව කථාව මිල දී ගත්හ.

එදින සවස පහට පමණ ඔවුන් ඇරිස් ගේ උපන්දින සාදයට ගියෝය. ඇයගේ අනිත් මිතුරියන් ද එයට පැමිණ සිටියහ. ඉතා අලංකාර රෝස පාට කේක් එකක ඉටි පන්දම් 10 ක් දල්වා තිබුණි. ඉන්පසු ඇරිස් කේක් කපන අතරතුර සියලු දෙනාම එකතු වී උපන්දින ගීතය සතුටින් ගායනා කළහ.

ඇරිස් කේක් එක කපා පළමුව ඇයගේ මවට ද පියා ට ද කවා අනතුරුව යහළුවන් කිහිප දෙනෙකුට ද කේක් කැවුවාය

අනතුරුව පැමිණි සියලු දෙනා කේක් කා බීම පානය කළෝය.

ඉන්පසු සියලු දෙනා තම තමන් රැගෙන ආ තෑගි ඇරිස්ට ලබාදී සුභ පැතූහ. ඒ අතර තුර දෙමාව්පියෝ සතුටු සාමිච්චියේ යෙදෙන අතර අපි යහළුවන් එකතු විවිධ ක්‍රීඩා කරමින් විනෝද වුනෙමු.

රාත්‍රී 07.00 ට පමණ ඇරිස්ගේ දෙමව්පියන් සියලු දෙනාටම රාත්‍රී ආහාර භෝජනයට ආරාධනා කළෝය. රාත්‍රී ආහාරයට ඉතා රසවත් කෑම වර්ග සහ රසවත් අතුරුපස කිහිපයකින් ද සමන්විත විය. උත්සවය අවසානයේ ඇරිස්ට හා ඇගේ දෙමවුපියන්ටද ස්තුති කර සමුදී රාතී 8 පමණ අපි නිවෙස් කරා ගියෙමු.

කාලය කෙමින් කෙමින් ගත විය. පළමු වන පාසල් වාරය අවසන් වී නිවාඩු කාලය ද ආරම්භ විය. නිවාඩු කාලයෙන් සති දෙකක් පමණ ගත වූ පසු " මේ දවස් වල රැට කුස්සියේ එළියේ තියෙන කෑම වර්ග වල සමහර දේවල් පොඩ්ඩ පොඩ්ඩ අඩු වෙනවා වගේ මට තේරෙනවා, " මව පැවසුවාය. නමුත් සියලු දෙනාට ම මේ සඳහා කීමට දෙයක් නොතිබිණි.

දිනපතා මව මේ කාරණාව කීම දරුවන්ට මහත් හිසරදයක් වූ නිසා මේ ගැන සොයා බැලිමට ඔවුන් තිරණය කළහ. දවසක් සවස තේ පානයෙන් පසු ඔවුන් ආලින්දයට එක් රැස් වී මේ ගැන සාකච්ඡා කළෝය. එක එක්කෙනා තම තමන්ගේ යෝජනා ඉදිරිපත් කළේය.

මුලින් ම ඉදිරිපත් වූ මල්ලී "අපි එක එක්කෙනා පැය 2ක් බැගින් ඇහැරලා ඉදලා බලා ගෙන ඉදිමු" කීය.

"අපි එන්නේ නෑ ඒක මහ පිස්සු වැඩක් මල්ලි" ලුපිටා කිවාය.

"එහෙනම් අපි තාත්තාගෙන් රේකෝර්ඩර් එකක් ඉල්ලාගෙන ඒ කවුද? යන්න කියලා බලමු යි " කැතරිනා කිවාය.

"ඒක හොඳයි" අනිත් තිදෙනාම ඒ අදහසට එකඟ විය.

හවස තාත්තේ ඔයාට පුළුවන්ද අපිට විඩියෝ රෝකෝඩර් එකක් ගෙනත් දෙන්න. කැතරිනා ඇසුවේය.

තාත්ති අපිට පැය 12 ක් විතර රේකෝර්ඩ් කරන්න පුළුවන් විඩියෝ රේකෝරඩර් එකක් තිබ්බොත් ඇති" නංගි කිව්වාය.

ඊළඟ දිනයේ දීම තාත්තා විඩියෝ රේකෝඩර් එකත් ඔවුන් රැගෙන අවේය. ඔවුන් උදෑසන 06.00 සිට සවස 6.00 දක්වා කුස්සියේ සවි කර තබා ඉන්පසු සතර දෙනාම එය පරිඝනකයට සවි කර බැලුහ.

" කවුරුත් නැනේ" මල්ලි කිවේය

"එහෙනම් මේ කෑම කන එක්කෙනා රැට වෙන්න ඇති එනවා ඇත්තේ" කැතරිනා කීවාය.

ඉන්පසු ඔවුන් කැමරාව නැවතත් ආරෝපණය කර නැවත සවස 06.30 සිට උදෑසන 06.30 දක්වා කුස්සියේ සවි කර තැබුහ. උදෑසනට විඩියෝ රේකෝඩර් එක විඩියෝ පරිගණකයට ආරෝපණය කර විඩියෝ නැරඹුහ.

"අක්කේ මේ පාන්දර 2.35 මියෙක් කුස්සියට එනවා" මල්ලි ලුපිටාට කිවේය.

"එහෙනම් මේ මීයා තමයි කෑම අරන් යනවා ඇත්තේ" ලුපිටා කිව්වාය.

ඉන් පසු මේ අයුරින් දවස් 4ක් ම සිදුවිය.

“අපි දැන් මේකා කොහේද යන්නේ කියලා බලමු ?”කැතරිනා කිව්වාය.
ඔවුන් විඩියෝ රේකෝඩර් එක තරමක් ඉදිරියට ගෙන ගොස් කැලැවේ තැබුහ. මෙසේ දින කීපයක්ම රෙකෝඩරය තබන ස්ථානය වෙනස් කරමින් පරික්ෂා කර අවසානයේදී දින 5 කට පසු දින එය පරික්ෂා කළ පසු “මේ මීයා මේ පදුර අස්සට තමා යන්නේ” මල්ලි කිවේය.
ඉන්පසු ඔවුන් පසු දින උදසනම එම පදුර ළඟට ගොස් බැලුවෝය. එම පදුර පිටුපස මහා විශාල ගල් තලාවකි. ටික දවසකට පසු තාත්තා සමඟ එම ගල් තලාව මත තිබූ පිපිරවිය හැකි ස්ථානයක් සොයා ගෙන ගත් ඔවුන් එම ස්ථානය ඕසම් වීදියේ පොලිසියේ සහය ඇතිව පුපුරවා ගෙන ගල ඇතුලට ගිහය.

ටික දුරක් යන විට ඔවුන් මිනිසෙකුගේ හා බල්ලෙකුගේ ඇටසැලිල්ලක් දක්හ. තවද ඔවුන් එම ඇටසැකිළි දෙක වටේ ට ඇති අල ආදී කැම ද දුටුහ.
“ඒ කියන්නේ මේ මියා කෑම අරන් යන්නේ මේ දෙදෙනාට ද?” ලුපිටා ට ඉබේ ම කියවුණි.
“ඒ කියන්නේ මේ මීයා තමයි හොරා ” මල්ලී ද එයට හවුල් විය.
මුළින් ම තාත්තාගේ උපදෙස් පරිදි සියලු දෙනාම ඕසම් වීදියේ පොලිසිය ට ගොස් ඒ පිළිබද වාර්තා කළහ.

පොලිස් පරීක්ෂණ වලට අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහය ඇතුව මේ ඇටසැකිළි වල වයස තීරණය කරන ලදි. ඉන්පසු ඔවුන් අතුරුදහන් වූවන්ගේ ලයිස්තුව පරීක්ෂා කර බලා එක පවුලක් තෝරා ගෙන ඔවුන් ඒ පවුලෙන් විස්තර විමසා බැලුහ.

ඒ අනුව තම දරුවා සහ මේ බල්ලා මිට අවුරුදු 20- කට කලින් අතුරුදහන් වූ බවත් අද වන තුරුත් කිසිම තොරතුරක් නොළැබුණ බවත් ඒ පියා පැවසීය .

තවදුරටත් කතා කළ ගැහැණු දරුවාගේ දෙමාපියන් කියා සිටියේ "එක දවසක් මගේ දුවයි, මේ බල්ලයි ඇවිදින්න ගිහින් අපි දෙන්නා ගෙදර නැති වේලාවක. එහා ගෙදර අක්කා කියලා ගිහින් තියෙන්නේ පාසලේ වැඩකට පැළ වගයක් හොයන්ට යනවා කියලා, අපි ගෙදර එනකොට රෑ වෙලා තිබුණා. දූව ගෙදර නැති බව අපි හැම තැනටම දැන්වූවා. මූළු ගමම එකතු වෙලා දරුවා ව හෙවුවා.

ටික දවසක් යනකොට අපට මළ සිරුරු කීපයක් හමු වුනාට ඒ අපේ දරුවා නෙමෙයි. අදටත් ඒ දරුවාට වුන දේ අපි දන්නේ නැහැ.

ඉන් පසු එම මව ඇඩුවාය. ටික වේලාවකින් මව මෙසේ කිව්වාය.

“මගේ දුවගේ නම ශිනාය. එයා හරිම ලස්සනයි ඒ වගේම කඩිසරයි. එයාගේ හොඳම යාළුවා තමයි Rex මෙයයි බල්ලයි ඇවිදින්න යන්නේ එකටමයි

ඉන් පසු මොවුන් විවිධ වෛද්‍ය පරීක්ෂණ වලට යොමු කරන ලදි. සති කීපයකට පසුව නැවතත් පොලීසියෙන් කැඳවීමක් ලැබුණි.

එහේ යනවිට ශිනායා ගේ දෙමව්පියන්ද පැමිණ තිබුණි. ළමයි දුටුව විගස ඔවුන් පැන ගෙන ඇවිත් බදා ගෙන ඇඩුවෝය.

“ඉතින් ඔයාලා හතරදෙනා නිසා තමයි අවුරුදු 20 කට පසු ව මගේ දරුවට මොකද වුණේ කියලා මම හොයා ගත්තේ, ඉතින් මම ඔයාලට පොඩි තෑග්ගක් ගෙනාවා”

තරමක් සංවේදී වීමෙන් පසු ශයිනීගේ පියා නැවතත් කථා කරමින් කියා සිටියේ “මෙතන තියෙනවා මගේ ශියිනි ලියපු පර්යේෂණ පොත් පත් , තව අපි ශයිනි වෙනුවෙන් ඉතිරි කළ මුදල් ටිකක් ඒ ඔක්කෝම ටික ඔයාලාට දෙන්නම් ඔයාලා ඉදිරියටත් මේ වගේ වීර ක්‍රියා කරනවා නම් ඔයාලා ට මේවා වැදගත් වේවී. තව මොනවා හරි උදව්වක් ඔන නම් කියන්න, මේ කළ උදව්ව වෙනුවෙන් මම ඔයාලාට ඕන දෙයක් කරලා දෙන්නම් මගේ ශයිනි වෙනුවෙන්” . එසේ පවසමින් ඒ දෙමව්පියන් තම දූරකථන අංකය ද ලබා දී නිවස කරා පිටත්වී ගියේය.

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම

ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

bflbmmfkmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmmm